**සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදල - 2019**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

**--------------------------------**

සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වා ගෙනයාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් අරමුදල විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 57 ඡේදය ප්‍රකාරව, දේපල අයිතමයක මුළු පිරිවැය හා සසඳන විට සැලකිය යුතු පිරිවැයකින් සමන්විත එම අයිතමයේ කොටස් සෑම එකක්ම වෙන් වෙන්ව ගෙන ක්ෂය කළ යුතු වුවද, මුළු පිරිවැය රු.126,255,800 ක්වූ නිලාවේලි පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිල්ල සහිත අක්කර 7 පර්චස් 37 ක ඉඩම, ඉඩම් හා ගොඩනැඟිලි ලෙස වෙන් වෙන්ව හඳුනාගෙන ක්ෂය කර නොතිබුණි. | නිලාවේලි පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිල්ල සහ ඉඩම වෙන් වෙන් වශයෙන් දැනට තක්සේරු කොට නොමැති බැවින් එය ඉදිරියේදී වෙන් වෙන් වශයෙන් තක්සේරු කර ක්ෂය කිරීම් ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව ගිණුම් පිළියෙල කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බැංකු මූල්‍ය අංශයෙන් ප්‍රතිපූර්නය කර ගත යුතු, නව පවුල් ලක්ෂ 6 කට සහනාධාර ලබාදීමේදී සමෘද්ධි හිමිකම් සහතිකපත් මුද්‍රණය කිරීමට හා උත්සව වියදම් වෙනුවෙන් අරමුදලින් වැයකර තිබුණු රු.113,074,862 ක් ලැබිය යුතු මුදල් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | මෙම වියදම් මේ දක්වා ප්‍රතිපූර්ණය කර නොමැති හෙයින්, එය ලැබිය යුතු මුදල් ලෙස පෙන්නුම් කිරීම තුලින් එම වර්ෂයේ අතිරික්තය වැඩියෙන් පෙන්නුම් කිරීමක් සිදු වන බැවින් ලැබිය යුතු මුදල් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොමැති බවත්, අරමුදලේ භාරකාර මණ්ඩලයේ උපදෙස් පරිදි එම මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු දැනට සිදු කරගෙන යනු ඇත. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2015 වර්ෂයේ සිට පැවත එන වැඩිපුර ලැබුණු රක්ෂණ වාරික මුදල් ගිණුමේ හා පොදු තැන්පත් ගිණුමේ පැවති පිළිවෙලින් රු.968,265 ක් හා රු.38,050 ක් වූ බැර ශේෂ හඳුනාගැනීමට අවශ්‍ය තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම මගින් වැඩිපුර ලැබුණු රක්ෂණ වාරික මුදල් හා පොදු තැන්පත් ගිණුමේ ශේෂය සමුච්චිත අරමුදලට බැර කිරීමට කටයුතු කරනු ලැබේ. | ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කල යුතුයි. |
| (ඇ) | එකතුව රු11,045,973 ක් වූ ගිණුම් විෂයන් 03 ට අදාළව උප ලේඛන හා ශේෂ සනාථ කිරීම් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම් මඟින් එය සමුච්ත අරමුදලට බැරකර පෙන්නුම් කිරීමට කටයුතු කර ඇත. | අදාළ උපලේඛන හා ශේෂ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2016 මාර්තු 31 දිනැති අංක 2016/05 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර වත්කම්වල නිවැරදිතාවය සනාථ කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදලේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු මේ දක්වා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ සිදුකර ඇත. 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 චක්‍රලේඛ ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ කටයුතු ඉදිරියේදී සිදු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | චක්‍රලේඛ හා විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 371(2)ආ | කාර්යය නිම කළ විගසම තත්කාර්ය අතුරු අග්‍රිමය පියවිය යුතු වුවද, නව සහනාධාර හිමිකම් නිකුත් කිරීමේ කටයුතුවල සංග්‍රහ වියදම් සඳහා අවස්ථා 06 කදී නිකුත් කර තිබුණු එකතුව රු.600,000 ක අත්තිකාරම් අදාළ කාර්ය නිමවී දින 195 ක ප්‍රමාදයක් සහිතව පියවා තිබුණි. | 2019 නව සහනාධාර හිමිකම් නිකුත් කිරීමේ දී සංග්‍රහ වියදම් සඳහා ලබා දී තිබූ අත්තිකාරම් පියවීමේ වවුචර්පත් අදාල නිලධාරීන් විසින් නියමිත කාලපරිච්ඡේද තුල ඉදිරිපත් කර තිබුණ ද එම වවුචර් පත්වලට අමුණා තිබූ ලිපි ලේඛනවල පැවති අඩුපාඩු හේතුවෙන් ඒවා සම්පූර්ණ කර ගිණුම්ගත කිරීම 2019 දෙසැම්බර් මස සිදු කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කලයුතුයි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 1,450,588,357ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,150,393,688 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.300,194,669 වර්ධනයක් නිරීක්ෂණය විය. දායක මුදල් රු 205,928,000 කින් හා පොලී ආදායම් රු 157,915,338 කින් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අසනීපයෙන් පෙළුණු විශ්‍රාමික රජයේ බැංකු නිලධාරියෙකු අඩු ආදායම්ලාභියෙකු වශයෙන් ප්‍රකාශ කර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව රු.480,000 ක් වැයකර එම රෝගියාට වෙන්ටිලේටර් යන්ත්‍රයක් ලබාදී තිබුණි. අදාළ අවශ්‍යතාවය ඉටු වූ පසු යන්ත්‍රය රජයේ රෝහලක් වෙත භාර දිය යුතුය යන කොන්දේසියට එළඹ තිබුණු නමුත් 2019 අගෝස්තු 05 දින රෝගියා මියගිය පසු එම කොන්දිසිය ප්‍රකාරව කටයුතු ඉටුකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | එවකට විෂයභාර ගරු ඇමැතිතුමා වෙතින් කරන ලද ඉල්ලීමකට අනුව, සමාජ ආරක්ෂණ භාරකාර මණ්ඩල උපදෙස් හා අනුමැතිය යටතේ අදාල රෝගී කාන්තාවට වෙන්ටලේටර් යන්ත්‍රය ලබා දී ඇත. තවද එම භාවිතයෙන් පසුව එම යන්ත්‍රය නැවත එවැනි රෝගීන්ට භාවිතයට ගැනීම සඳහා උපදෙස් ලබාදී තිබුණද, එම යන්ත්‍රය භාරගත් පුද්ගලයන් දැනට එම ලිපිනයෙහි නොමැති බැවින් ලබාදුන් උපදෙස් අනුව කටයුතු කිරීමට නොහැකි වූ අතර, එම යන්ත්‍රය නැවත ලබා ගැනිමට අවශ්‍ය පියවර ගනිමින් පවතී. | අදාල කොන්දේසි ප්‍රකාරව කටයුතු කල යුතුයි. |
| (ආ) | කාන්තා දිනය මුල්කරගෙන ගාල්ල බද්දේගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ අඩු ආදායම්ලාභි ගෘහණියන් සවිබල ගැන්වීමේ වැඩසටහනට අදාළව කාන්තාවන් 250 දෙනෙකු වෙත රු.625,000 ක් ලබාදී තිබුණු නමුත් ඔවුන් අඩු ආදායම්ලාභීන්ද සමෘද්ධිලාභීන්ද යන්න සනාථ කර ගෙන නොතිබුණි. | සමෘද්ධි සමාජ ආරක්ෂණ භාරකාර මණ්ඩල පත්‍රිකා අංක 2019/SSSF/02/03 අනුව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර, එහිදි ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ලබාදුන් කාන්තා ව්‍යවසායකයින් 250 ක නාම ලේඛනය වෙනුවෙන් රු. 625,000 ක ප්‍රතිලාභ ලබා දී ඇත. | අඩු ආදායම්ලාභීන්ද සමෘද්ධිලාභීන්ද යන්න සනාථ කර ප්‍රතිලාභ ලබාදිය යුතුයි. |
| (ඇ) | නව සමෘද්ධි සහනාධාර හිමිකම්පත් බෙදාදීමේ උත්සව සඳහා දිස්ත්‍රික් අධ්‍යක්ෂ කාර්යාල 25 ක් වෙත රු.69,000,000 ක අත්තිකාරම් නිකුත් කර තිබුණු නමුත්, 2019 ජුනි 15 දින වන විට එම උත්සවය අවසන්වී තිබුණද 2019 දෙසැම්බර් 31 දින වන විටත් පියවා ගැනීමට කටයුතු කර නොතිබුණු අත්තිකාරම් රු.39,255,315 ක් විය. | නව සමෘද්ධි සහනාධාර හිමිකම්පත් බෙදා දීමේ උත්සවය සඳහා දිස්ත්‍රික් කාර්යාල 25 ක් වෙත ලබා දී තිබු අත්තිකාරම් මුදලින් මේ වන විට නොපියවා ඇති අත්තිකාරම් මුදල රු.8,764,103.42 කි. | ලැබිය යුතු මුදල් අයකර ගැනිමට කටයුතු කල යුතුය. |
| (ඈ) | අරමුදලේ අරමුණුවලට අදාළ නොවන කාර්යයක් වන නව සමෘද්ධිලාභීන් සඳහා හිමිකම්පත් මුද්‍රණය කිරීම, බෙදාහැරීම හා උත්සව වියදම් වෙනුවෙන් අවස්ථා 10 කදී රු.116,485,853 ක් වැය කර තිබුණු අතර බැංකු සංගම්වලින් එම වියදමෙන් රු.3,410,992 ක් පමණක් ප්‍රතිපූර්ණය කර තිබුණි. | 2019 වර්ෂයේ ප්‍රජා මුල බැංකු මගින් ප්‍රතිපූර්ණය කරගැනීමේ පදනම මත මෙම මුදල් නිදහස් කර ඇති අතර, සමෘද්ධි සමාජ ආරක්ෂණ භාරකාර මණ්ඩල උපදෙස් පරිදි හිඟ මුදල් බැංකු මගින් නැවත අය කර ගැනීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. | ලැබිය යුතු මුදල් අයකර ගැනිමට කටයුතු කල යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදයේ ඇතුළත් මුදල් රෙගුලාසි 877(2) (ඇ) ප්‍රකාරව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී මාස 02 ක් තුළ කාර්යසාධන වාර්තාවක්ද සමඟ මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වසර 02 ක ප්‍රමාදයකින් පසුව 2022 නොවැම්බර් 10 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි. | 2018, 2019 සහ 2020 වර්ෂවල අවසන් ගිණුම් 2022 මාර්තු 09 වන දින ද 2021 වර්ෂයේ අවසන් ගිණුම 2022 මාර්තු 28 දින ද රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත පිටපතක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති බව. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව අදාළ කාලය තුළ ගිණුම් ඉදිරිපත් කළ යුතුය. |

**4.2 අයවැය පාලනය**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදයේ ඇතුළත් මුදල් රෙගුලාසි 877(1) ප්‍රකාරව අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | සමාජ ආරක්ෂණ අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් 2022 වර්ෂයේ අයවැය ලේඛනය සහ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ඇති බව. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව අදාළ කාලය තුළ ලේඛනය සකස් කර ඉදිරිපත් කළ යුතුය. |